# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,470 - 2025 ජනවාරි මස 02 වැනි සිකුරාදා - 2026.01.02**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී. )


## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත. )


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... | 02 |
| අතුරු ව්‍යවස්ථා ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... | 04 |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... | 11 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් | |


**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 ජනවාරි මස 23 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 ජනවාරි මස 09 වැනි දින දහවල් 12. 00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට්* පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය. "

2026 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**එස්. ඩී. පාඬිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

මෙම *ගැසට් පත්‍රය www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


1 - B 082754 — - (2026/01)
F 1 -

# පළාත් සභා නිවේදන

## උතුරු මැද පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය

වරිපනම් ප්‍රතිශතය සඳහා අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 134 (1) උපවගන්තියෙන් ලේකම් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව හිඟුරක්ගොඩ බල ප්‍රදේශීයේ දියුණු කළ ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ දේපළ මත වාර්ෂික වටිනාකමින් සියයට හතක (7%) වාර්ෂික වරිපනම් බද්දක් පනවා අය කිරීම සඳහා හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්යය කර්තව්‍ය ඉටු කරන හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම් ආර්. ඒ. හේමකාන්ති ගෙන ඇති තීරණය අනුමත කරනු ලබන්නේ ය.

ආණ්ඩුකාරවර,
පළාත් පාලන විෂය භාර අමාත්‍ය,
උතුරු මැද පළාත.

2025 සැප්තැම්බර් මස 10 දින,
උතුරු මැද පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය.

01 - 44

---

## වයඹ පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 57 (2) උපවගන්තියට අනුව නිකුත් කරන දැන්වීම

පහත සඳහන් කර ඇති ලියාපදිංචිය අවලංගු කළ සමුපකාර සමිතිවල ඈවර කටයුතු අවසන් කර ඇති බව එම ලියාපදිංචිය අවලංගු කළ සමුපකාර සමිතිවල සියලුම සාමාජිකයින්ට, ණය හිමියන්ට හා ශ්‍රී ලංකාවේ සියලු පුරවැසියන්ට 1983 අංක 32 හා 1992 අංක 11 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත්වලින් සංශෝධිත 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 57 (2) උපවගන්තියට අනුව මෙයින් දන්වා සිටිමි.

පහත සඳහන් කර ඇති ලියාපදිංචිය අවලංගු කළ යම් සමුපකාර සමිතියකින් තමන්ට ලැබිය යුතු යම් හිමිකමක් තිබේනම්, මෙම දැන්වීම ශ්‍රී ලකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කළ දින සිට මාස 03ක් ඇතුළත එම හිමිකමඉල්ලා සිටීම සිදු කළ යුතු බවට ශ්‍රී ලංකාවේ සියලු පුරවැසියන්ට, ලියාපදිංචිය අවලංගු කළ සමුපකාර සමිතියේ සාමාජිකයින්ට හා ණය හිමියන්ට මෙයින් දන්වමි. මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ කළ දිනයේ සිට මාස 03ක් ගත වූ පසු ඉදිරිපත් කරන කිසිම හිමිකම් කියාපෑමක් පිළිබඳව සලකා නොබලන බව ද දන්වා සිටිමි.

**සමිති ලේඛනය**

| *අනු. අංකය* | *සමිතියේ නම* | *ලියාපදිංචි අංකය* | *වසා දමන ලද දිනය* |
|---|---|---|---|
| **කුරුණෑගල කොට්ඨාසය** | | | |
| 1 | සීමාසහිත අලව්ව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිති සංගමය | වප/කු/163 | 2024.07.20 |
| 2 | සීමාරහිත පන්නව සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | වප/කු/297 | 2024.06.28 |
| 3 | සීමාසහිත බලගහයාය යශෝධරා කාන්තා ස්වශක්ති සමුපකාර සමිතිය | වප/කු/367 | 2024.08.31 |
| 4 | සීමාසහිත කඩිහාරේ එකමුතු ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන සමුපකාර සමිතිය | වප/කු/43 | 2025.03.07 |
| 5 | සීමාසහිත දුටුගැමුණු මධ්‍ය මහා විද්‍යාලයීය පාසැල් සමුපකාර සමිතිය | කු/1500 | 2024.11.25 |
| **කුලියාපිටිය කොට්ඨාසය** | | | |

| අනු. අංකය | සමිතියේ නම | ලියාපදිංචි අංකය | වසා දමන ලද දිනය |
|---|---|---|---|
| 1 | සීමාසහිත බක්මීරුප්ප විකසිත සත්කාර්ය ස්වශක්ති සමුපකාර සමිතිය | වප/කුලි/139 | 2024.07.15 |
| 2 | සීමාසහිත දුම්මලසූරිය කිරි නිපදවන්නන්ගේ ප්‍රාථමික සමුපකාර සමිතිය | කුලි/198 | 2024.12.31 |
| 3 | සීමාසහිත බිබිලාදෙනිය සත්කාර්ය ස්වශක්ති සමුපකාර සමිතිය | වප/කුලි/09 | 2024.12.30 |
| 4 | සීමාරහිත ගොඩවෙල තෙලහැර සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | වප/කු/හෙ/56 | 2024.07.20 |
| 5 | සීමාසහිත නිජබිම ස්වශක්ති පදනම මාරගස්වැටිය නෙළුම් සමුපකාර සමිතිය | වප/කු/හෙ/54 | 2024.07.21 |
| 6 | සීමාසහිත කඩවලගෙදර නවෝදා සත්කාර්ය ස්වශක්ති සමුපකාර සමිතිය | වප/කුලි/90 | 2024.12.31 |
| 7 | සීමාසහිත හොරගස්අගාර කිරි නිෂ්පාදන සමුපකාර සමිතිය | කුලි/453 | 2024.12.31 |
| 8 | සීමාසහිත හල්මිල්ලවැව සිද්ධාර්ථ මහා විද්‍යාලයීය පාසැල් සමුපකාර සමිතිය | කුලි/191 | 2024.12.31 |
| 9 | සීමාසහිත හෙට්ටිපොල නාගරික සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | වප/කු/හෙ/59 | 2024.05.15 |
| හලාවත කොට්ඨාසය | | | |
| 1 | සීමාසහිත මුක්කු තොඩුවාව සේමුතු ධීවර සමුපකාර සමිතිය | හලා/742 | 2024.08.31 |
| 2 | සීමාරහිත තොඩුවාව සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | හලා/510 | 2024.09.30 |
| 3 | සීමාසහිත වෙන්නප්පුව ඡන්ද කොට්ඨාසයේ ධීවර කාර්මිකයින්ගේ සමුපකාර සමිතිය | හලා/323 | 2024.12.31 |
| 4 | සීමාසහිත වැල්ල ශාන්ත අන්තෝනි ධීවර සමුපකාර සමිතිය | NWP/CH/AC/919 | 2024.05.13 |
| 5 | සීමාසහිත කුඩාමඩුවැල්ල කුඩාමඩු සත්කාර්ය ස්වශක්ති සමුපකාර සමිතිය | හලා/948 | 2024.04.08 |
| 6 | සීමාසහිත බොරලැස්ස කොස්ගහවත්ත කර්මාන්ත සංවර්ධන සමුපකාර සමිතිය | හලා/908 | 2024.12.24 |
| 7 | සීමාරහිත ඉහළ දුම්මලකොටුව සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | හලා/848 | 2024.05.21 |
| 8 | සීමාසහිත පුනපිටිය ශාන්ත සෙබස්තියන් සත්කාර්ය ස්වශක්ති සමුපකාර සමිතිය | හලා/853 | 2024.12.31 |
| 9 | සීමාරහිත බටහිර කටුකෙන්ද ධර්මෝදය සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | හලා/507 | 2024.10.31 |
| 10 | සීමාසහිත මණ්ඩල කුඩාව අල්මනාර් ධීවර සමුපකාර සමිතිය | හලා/887 | 2024.08.31 |
| 11 | සීමාසහිත දෙමටපිටිය ඉෂාරා කිරි නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය | NWP/CH/AC/1032 | 2024.12.31 |
| 12 | සීමාසහිත පොත්තුවිල්ලුව ප්‍රගති සත්කාර්ය ස්වශක්ති සමුපකාර සමිතිය | හලා/875 | 2024.11.10 |
| 13 | සීමාසහිත එකමුතු ධීවර සමුපකාර සමිතිය | NWP/CH/AC/1011 | 2024.04.18 |
| 14 | සීමාසහිත සන්දනන්ගම සූර්ය සත්කාර්ය ස්වශක්ති සමුපකාර සමිතිය | NWP/CH/AC/996 | 2024.08.31 |
| 15 | සීමාසහිත වන්නිමුන්දලම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ධීවර සමුපකාර සමිතිය | හලා/696 | 2024.08.31 |
| 16 | සීමාසහිත පුංචි ගුණ්ඩුව ශාන්ත පේදුරු ධීවර සමුපකාර සමිතිය | NWP/CH/AC/1002 | 2024.08.22 |
| 17 | සීමාසහිත බරුදැල්පොල නිර්මල සත්කාර්ය ස්වශක්ති සමුපකාර සමිතිය | NWP/CH/AC/982 | 2024.10.15 |
| 18 | සීමාසහිත බටහිර කොලින්ජාඩිය ග්‍රාමසේවා නිලධාරි කොට්ඨාසයේ ධීවර සමුපකාර සමිතිය | හලා/689 | 2024.11.15 |

| අනු. අංකය | සමිතියේ නම | ලියාපදිංචි අංකය | වසා දමන ලද දිනය |
|---|---|---|---|
| 19 | සීමාසහිත කොයිලාඩිගම ග්‍රාමසේවා නිලධාරි කොට්ඨාසයේ ධීවර සමුපකාර සමිතිය | හලා/711 | 2024.11.30 |
| 20 | සීමාසහිත ඉහල මාවිල සමාධි සත්කාර්ය ස්වශක්ති සමුපකාර සමිතිය | NWP/CH/AC/947 | 2024.04.20 |
| 21 | සීමාසහිත බටහිර නයිනමඩම ධීවර සමුපකාර සමිතිය | හලා/725 | 2024.12.24 |
| 22 | සීමාසහිත පුත්තලම දිස්ත්‍රික් විසිතුරු මත්ස්‍ය හා ජලජ වගාකරුවන්ගේ සමුපකාර සමිතිය | NWP/CH/AC/988 | 2024.04.10 |
| මහව කොට්ඨාසය | | | |
| 1 | සීමාසහිත පන්වැව සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | වප/කු/මප්‍රා/03 | 2024.04.08 |
| 2 | සීමාසහිත ඇඹෝගම එක්සත් සුචරිත කාන්තා ස්වශක්ති සමුපකාර සමිතිය | වප/කු/405 | 2024.11.06 |
| 3 | සීමාරහිත වදුරැස්ස සමගි සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | වප/කු/මප්‍රා/09 | 2024.06.20 |

වසන්ත ගුණසේකර,
සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් (වයඹ).

01-41

---

# තනතුරු - ඇබෑර්තු

**ක්‍රීඩා හා යෞවන කටයුතු, පළාත් සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා අමාත්‍යාංශය**

දකුණු පළාත් සමාජ සුබසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ III ශ්‍රේණියේ (PL - 2) ඕවර්සියර්, අරක්කැමි යන තනතුරු සඳහා විවෘත බඳවා ගැනීම - 2025

දකුණු පළාත් සමාජ සුබසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව යටතේ පාලනයවන ආයතන හා රැකවරණ මධ්‍යස්ථාන සඳහා ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ III ශ්‍රේණියට අයත් ඕවර්සියර් හා අරක්කැමි තනතුරුවල පවතින පුරප්පාඩු සඳහා පහත සුදුසුකම් හා පළපුරුද්ද සපුරා ඇති අයගෙන් (කාන්තා/පිරිමි) අයදුම්පත් කැඳවනු ලැබේ. (ආයතනයේ පවතින පුරප්පාඩු තනතුරු කාන්තා/පිරිමි අය වනවිට බඳවා ගැනීම් පරිපාටිය අනුව බඳවා ගනු ලබන්නේ පිළිවෙලින් කාන්තා/පිරිමි නිලධාරින් වේ.)

01. තනතුරේ ස්වභාවය.- මෙම තනතුර ස්ථිරය.

02. වැටුප් පරිමාණය.-

I. 2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය,
**රු. 41,800 - 10x490 - 10x540 - 10x590 - 12x630 - රු. 65,560/- වේ.**
ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ.

(කලින් කලට අනුමත කරනු ලබන වැටුප් චක්‍රලේඛ අනුව වැටුප් කේත අංකයන් හා/හෝ වැටුප් පරිමාණයන් වෙනස් විය හැකිය.)

03. සුදුසුකම් හා පළපුරුද්ද.-

03.1 අධ්‍යාපන සුදුසුකම්.-අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (02) සහිතව විෂයයන් හයක් (06) සමත් වී තිබීම.

03.2 වෘත්තීය සුදුසුකම්.-

| තනතුර | පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව | වෘත්තීය සුදුසුකම් |
|---|---|---|
| අරක්කැමි | 02 | රජයේ හෝ රජයේ ලියාපදිංචි කරන ලද ආයතනයක් මගින් පවත්වනු ලබන ආහාර පිසීම/සූපවේදය පිළිබඳව හය මසකට (06) නොඅඩු NVQ වෘත්තීය පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබීම. |
| ඕවර්සියර් | 01 | ළමා රැකවරණය පිළිබඳ පිළිගත් ආයතනයක මාස හයකට (06) නොඅඩු පාඨමාලාවක් හදාරා NVQ 3 හෝ ඊට ඉහළ මට්ටමක සහතිකයක් ලබා තිබීම. |

03.3 පළපුරුද්ද.-

| තනතුර | වෘත්තීය සුදුසුකම් |
|---|---|
| අරක්කැමි | රාජ්‍ය, අර්ධ රාජ්‍ය හෝ පිළිගත් පුද්ගලික ආයතනයක වර්ෂයකට නොඅඩු කාලයක අඛණ්ඩ සේවා පළපුරුද්දක් ලබා තිබීම. |
| ඕවර්සියර් | දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලද ස්වේච්ඡා ළමා නිවාසයක වර්ෂයකට නොඅඩු කාලයක අඛණ්ඩ සේවා පළපුරුද්දක් ලබා තිබීම. |

03.3 කායික සුදුසුකම්.-

i. අයදුම්කරු තනතුරේ රාජකාරි කිරීමට ප්‍රමාණවත් මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.

ii. දකුණු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටු කිරීමටත්, ළමයින් සමග කටයුතු කිරීමටත් සුදුසු ශාරීරික හා මානසික වශයෙන් යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

iii. ළමයින් සමග කටයුතු කිරීමට සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවයක් ඇති බවට වෛද්‍ය වාර්තාවක් මගින් වාර්ෂිකව සනාථ කළ යුතුය.

03.5 වෙනත්.-

i. අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

ii. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

iii. අයදුම්පත් කැඳවන අවසාන දිනට පූර්වාසන්න වසර තුනක් අඛණ්ඩව දකුණු පළාතේ ස්ථිර පදිංචිය තිබිය යුතුය. (පදිංචිය ඡන්ද හිමි නාමලේඛනයක සහතික කළ උද්ධෘතයක් මගින් සනාථ කළ හැකි විය යුතුය.)

iv. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවන නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සියලුම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය. (අයදුම්කරුවන් විසින් සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ සහතිකවල පිටපත් අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය.)

v. නීතිය ඉදිරියේ වරදකරුවෙකු නොවූ නීතිගරුක පුද්ගලයෙකු බවට පදිංචි ප්‍රදේශය අයත් පොලිස් ස්ථානයේ ස්ථානාධිපති විසින් නිකුත් කරන පොලිස් සහතිකයක් බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණයේ දී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

vi. පූර්ව අපරාධමය හෝ මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ චෝදනාවකට ලක් නොවූවෙකු හා යහපත් චරිතයකින් හා මනා සමාජ හැසිරීමකින් හෙබි අයෙකු බවට ග්‍රාම නිලධාරි වාර්තාවක් හා තමන් පදිංචි ප්‍රදේශයේ සාමදාන විනිශ්චයකාරවරයෙකුගෙන් හා පූජ්‍ය පක්ෂයේ අයෙකුගෙන් ලබා ගන්නා චරිත සහතික 02ක් අයදුම්කරු විසින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය. නිවාසගත දරුවන්ගේ ආරක්ෂාව හා සුරක්ෂිතභාවය මෙම චරිත සහතිකයෙන් අපේක්ෂා කෙරේ.

vii. බඳවා ගන්නා අවස්ථාවේ දී ළමුන් සමඟ කටයුතු කිරීමට සුදුසු යහපත් කායික හා මානසික සෞඛ්‍ය තත්ත්වයක් ඇති බවට රජයේ වෛද්‍ය නිලධාරියෙකුගෙන් ලබා ගන්නා ලද සහතිකයක් අයදුම්කරු විසින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

04. වයස.-

i. අවම සීමාව : අවුරුදු 18
ii. උපරිම සීමාව : අවුරුදු 45

05. බඳවා ගැනීමේ ක්‍රමය.-

i. පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් ලත් බාහිර අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් හා ඒ ඒ තනතුරට අදාළ ප්‍රායෝගික පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ප්‍රමාණයක් ලබා ගන්නා අයදුම්කරුවන්ගෙන් සම්පූර්ණ කළ යුතු පුරප්පාඩු සංඛ්‍යාවෙන් 100% ක් බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

06. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය/ප්‍රායෝගික පරීක්ෂණය පිළිබඳ විස්තරය :

| *තනතුර* | *පරීක්ෂණය* | *කාලය* | *ලබාදෙන ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| ඕවර්සියර් | 1. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය | මිනිත්තු 30 | 100 |
| අරක්කැමි | 2. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය | මිනිත්තු 30 | 100 |
| | 3. ප්‍රායෝගික පරීක්ෂණය | පැය 1 | 100 |

07. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබාදෙන ආකාරය.-

| *ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂය* | *විෂය නිර්දේශය* | *උපරිම ලකුණු* |
|---|---|---|
| 01. පළපුරුද්ද | දකුණු පළාත් සමාජ සුබසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලද ස්වේච්ඡා ළමා නිවාසයක හෝ වැඩිහිටි නිවාසයක වසර 5ක් ඉක්මවා සේවය කර ඇති එක් වසරක් සඳහා ලකුණු 03 බැගින්. | 30 |
| 02. අධ්‍යාපන සුදුසුකම් | අ.පො.ස. (උ.පෙළ) සමත් වී තිබීම | 04 |
| | අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී ලබා ගන්නා එක් විශිෂ්ඨ සාමාර්ථයක් සඳහා ලකුණු 05 බැගින්. | 15 |
| | අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී ලබා ගන්නා එක් අධි සාමාර්ථයක් සඳහා ලකුණු 04 බැගින්. | |
| | අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී ලබා ගන්නා එක් සම්මාන සාමාර්ථයක් සඳහා ලකුණු 03 බැගින්. | |
| | අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී ලබා ගන්නා එක් සාමාන්‍ය සාමාර්ථයක් සඳහා ලකුණු 02 බැගින්. | |
| | අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී ලබා ගන්නා එක් විශිෂ්ඨ සාමාර්ථයක් සඳහා ලකුණු 03 බැගින්. | 18 |
| | බඳවා ගැනීමේ අවම සුදුසුකම ලෙස සලකන විෂයයන් දෙකකට ලබාගන්නා සම්මාන සාමාර්ථ දෙකට අමතරව අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී ලබා ගන්නා එක් අධි/සම්මාන සාමාර්ථයක් සඳහා ලකුණු 02 බැගින්. | |

| *ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂය* | *විෂය නිර්දේශය* | *උපරිම ලකුණු* |
|---|---|---|
| 03. විෂය දැනුම | අදාළ ක්ෂේත්‍රය පිළිබඳ දැනුම පරීක්ෂා කිරීමට සකසන ලද ව්‍යුහගත ප්‍රශ්න | 25 |
| 04. පෞරුෂත්වය හා ආකල්ප | සම්මුඛ පරීක්ෂණයේ දී පිළිබිඹු කෙරෙන පෞරුෂත්වය හා ආකල්ප | 08 |

08. ඇමුණුම් 01 පරිදි සකස් කරන ලද අයදුම්පත් **2026.02.02** දිනට පෙර ලේකම්, දකුණු පළාත් ක්‍රීඩා හා යෞවන කටයුතු, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා අමාත්‍යාංශය, 3 මහල, දක්ෂිණපාය, ලබුදූව, ගාල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනැවිත් භාරදීම් කළ යුතුය.

09. ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක්, අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීමේ අයිතිය දකුණු පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය සතු වේ.

කේ. යූ. චන්ද්‍රලාල්,
ලේකම්,
ක්‍රීඩා හා යෞවන කටයුතු, සමාජ සුභසාධන,
පරිවාස හා ළමාරක්ෂක සේවා අමාත්‍යාංශය.

2025 දෙසැම්බර් මස 27 දින,
03 මහල, දක්ෂිණපාය,
ලබුදූව,
ගාල්ල.

දකුණු පළාත් සමාජ සුබසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ශ්‍රේණියට (PL - 2) අයත් අරක්කැමි, ඕවර්සියර් තනතුරු සඳහා බඳවා ගැනීමේ ආදර්ශ අයදුම්පත්‍රය - විවෘත 2025

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා :

ඉල්ලුම් කරන තනතුර :

01. නම :

1.1 මුලකුරු සමග නම :..............................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.2 සම්පූර්ණ නම :..............................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම :..............................................................................................
(සිංහලෙන්/දෙමළෙන්)

02. ජාතික හැඳුනුම්පත් අංකය :..............................................................................

03. ස්ථිර පදිංචි ලිපිනය : (සිංහලෙන්/දෙමළෙන්) :..............................................................................
..............................................................................................
..............................................................................................

04. ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී : ☐ පුරුෂ : ☐

(අදාළ කොටුව තුළ ✓ලකුණ යොදන්න.)

05. උපන් දිනය : වර්ෂය :...................... මාසය :...................... දිනය :.....................

06. දුරකථන අංකය :..........................................................................................

07. විවාහක අවිවාහක බව : විවාහක : ☐ අවිවාහක : ☐

(අදාළ කොටුව තුළ ✓ලකුණ යොදන්න.)

08. ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද යන වග : ඔව් : ☐ නැත : ☐

(අදාළ කොටුව තුළ ✓ලකුණ යොදන්න.)

09. අයත්වන පරිපාලන දිස්ත්‍රික්කය :..........................................................................................

10. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :..........................................................................................

11. ග්‍රාම නිලධාරි කොට්ඨාසය :..........................................................................................

12. අධ්‍යාපන සුදුසුකම් :

12.1 අ. පො. ස. (සා. පෙළ) විභාගය පිළිබඳ විස්තර :

පළමුවර : වර්ෂය හා මාසය :......................................... විභාග අංකය :...........................................

දෙවනවර : වර්ෂය හා මාසය :......................................... විභාග අංකය :...........................................

| *විෂයය* | *පළමුවර* | *දෙවනවර* | *විෂයය* | *පළමුවර* | *දෙවනවර* |
|---|---|---|---|---|---|
| 1. | | | 6. | | |
| 2. | | | 7. | | |
| 3. | | | 8. | | |
| 4. | | | 9. | | |
| 5. | | | 10. | | |

13. වෙනත් අධ්‍යාපන සුදුසුකම්.-

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

14. වෘත්තීය සුදුසුකම් :

| ආයතනය | හදාරා ඇති පාඨමාලාව | කාලසීමාව |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

15. පළපුරුද්ද :

| ආයතනය | හදාරා ඇති පාඨමාලාව | කාලසීමාව |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

16. ඔබ කවරදාක හෝ යම්කිසි චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?

(අදාළ කොටුව තුළ ✓ලකුණ යොදන්න.)

ඔව් : ☐ නැත : ☐

(ඔව් නම් විස්තර කරන්න.)

.....................................................................................................................................................................
.....................................................................................................................................................................
.....................................................................................................................................................................
.....................................................................................................................................................................
.....................................................................................................................................................................

17. අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම ඉල්ලුම් පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ / හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි පාඩුව විඳ දරා ගැනීමට එකඟ වෙමි. තව ද, මෙහි සියලුම කොටස් සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ආ) මා විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකුවන බව ද, පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත්වන බව ද මම දනිමි.

(ඇ) අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් සියලු කරුණු ඉතා හොඳින් කියවා අවබෝධ කරගත් බවත්, එහි සඳහන් සියලු කරුණු හා කොන්දේසිවලට එකඟවන බවත් ප්‍රකාශ කරමි.

(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

දිනය ;............................... ......................................

අයදුම්කරුගේ අත්සන.

18. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම.-

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ...................................................................................................................... නැමැති අය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය ............................................................ දින මා ඉදිරිපිට දී ඉහත 17 ඡේදය යටතේ අත්සන තබන ලද බවත් සහතික කරමි.

.........................................
සහතික කරන්නාගේ අත්සන.

දිනය :..................................................................................................

සහතික කරන්නාගේ නම :...................................................................

තනතුර :...............................................................................................

ලිපිනය :..............................................................................................

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

19. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය : (රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.)

19.1 නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුව අනුව, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 05 තුළ, වැඩ, හැසිරීම, පැමිණීම සතුටුදායකය/අසතුටුදායකය.

සියලු වැටුප් වර්ධක උපයා ඇත / නැත
කිසිදු විනය දඬුවමකට ලක්වී නැත / ඇත

19.2 ඉල්ලුම් කරනු ලබන තනතුරකට තෝරාගනු ලැබුවහොත් වර්තමාන තනතුරින් මෙම නිලධාරියා මුදා හැරිය හැකිය/ නොහැකිය. ඉල්ලුම්පත්‍රය නිර්දේශ කරමි / නොකරමි.

දිනය :...............................

..............................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා
නිල මුද්‍රාව.

01 - 43

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

## මධ්‍යම පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයෙහි සත්ත්ව සංවර්ධන උපදේශක III ශ්‍රේණිය සඳහා විවෘත බඳවා ගැනීම - 2025

මධ්‍යම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයෙහි සත්ත්ව සංවර්ධන උපදේශක III ශ්‍රේණියේ තනතුරට අදාළ පුරප්පාඩු පිරවීම සඳහා මධ්‍යම පළාත තුළ පදිංචි සුදුසුකම්ලත් ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයෙන් ම අයදුම්පත් කැඳවනු ලැබේ.

**02.** **වැටුප් පරිමාණය :**

2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි MN 03-2025 වැටුප් කේතය මෙම තනතුරට හිමිවන අතර, එයට අදාළ වැටුප් පරිමාණය,
**රු. 52,250 – 10X800 – 11X1,190 – 10X1,320 – 10X1,350 – රු. 100,040/- ක්,**
වන අතර පත්වීම ක්‍රියාත්මකවන දින සිට ඔබට මෙම චක්‍රලේඛයේ උපලේඛන III හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.

**03.** **සේවා කොන්දේසි :**

3.1 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට ඔබ යටත් විය යුතුය.

3.2 මෙම තනතුරට බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබන අපේක්ෂකයින් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්ව මෙම සේවයට පත් කරනු ලැබේ.

3.3 තනතුරට බඳවා ගැනීමෙන් පසු මධ්‍යම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ සත්ත්ව සංවර්ධන උපදේශක තනතුරු සඳහාවන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ දැක්වෙන ආකාරයට අදාළ කාර්යක්ෂමතා කඩඉම් හා රාජ්‍ය භාෂා ප්‍රවීණතා විභාගවලින් සමත්විය යුතුය.

3.4 මෙම තනතුරට පත් කිරීමෙන් අනතුරුව මධ්‍යම පළාත තුළ වසර 05ක අවම සේවා කාලයක් අනිවාර්යයෙන් සේවය කළ යුතු අතර, එම කාලය තුළ දී මධ්‍යම පළාතෙන් පිටතට ස්ථාන මාරු ලබා ගැනීමට කරනු ලබන කිසිදු ඉල්ලීමක් සලකා බලනු නොලැබේ. තව ද, පත් කරනු ලබන සේවා ස්ථානයේ වැඩ භාරගත් දින සිට අවුරුදු 03ක අවම සේවා කාලයක් අනිවාර්යයෙන් ම සේවය කළ යුතුය.

3.5 මෙම තනතුරට බඳවා ගැනීමෙන් පසු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට, මධ්‍යම පළාත් මූල්‍ය රීති සංග්‍රහයට, මධ්‍යම පළාත් තාක්ෂණික සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයට, කාර්ය පරිපාටික රීති සංග්‍රහයට ද , මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසිවලට *නොහොත්* නියෝගවලට ද, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන වෙනත් රෙගුලාසි *නොහොත්* නියෝගවලට ද, අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නියෝගවලට ද අනුව කටයුතු කළ යුතුය.

**04.** **පවත්නා පුරප්පාඩු ක්ෂේත්‍රයන් :**

4.1 මධ්‍යම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ සත්ත්ව සංවර්ධන උපදේශක III ශ්‍රේණියේ පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කරනු ලබන අතර, මෙම තනතුරෙහි පුරප්පාඩු සඳහා බඳවා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

4.2 අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය **2026.01.23** දින වේ. අයදුම් කරන තනතුරට අදාළ සියලු සුදුසුකම් **2026.01.23** දින හෝ එදිනට පෙර සම්පූර්ණ කර තිබිය යුතුය.

**05. සුදුසුකම් :**

5.1 අධ්‍යාපන සුදුසුකම්.-

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය එකවර සමත්ව තිබීම ;

*සහ*

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) තාක්ෂණවේදය විෂය ධාරාව යටතේ ජෛව පද්ධති තාක්ෂණවේදය (විෂය අංක 66) හා තාක්ෂණවේදය සඳහා විද්‍යාව (විෂය අංක 67) කෘෂි විද්‍යාව (විෂය අංක 08) යන විෂයයන් තුන එකවර සමත් වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර) ;

*හෝ*

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විද්‍යාව විෂය ධාරාව යටතේ භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, සත්ත්ව විද්‍යාව, උද්භිද විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන් අතරින් විෂයයන් 03කින් විභාගය එකවර සමත් වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර).

5.2 *වෘත්තීය සුදුසුකම්.-*

තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පරිදි අවම වශයෙන් දෑ අවුරුදු (වසර දෙකක්) ජාතික වෘත්තීය කුසලතා (N.V.Q.) හය (06) මට්ටමේ කුසලතා සහතිකයක් සත්ත්ව පාලන හෝ කෘෂිකර්ම ක්ෂේත්‍රයෙන් ලබා තිබිය යුතුය. මේ සඳහා පහත පාඨමාලාවන් අදාළ කරගනු ලැබේ.

I. කරඳගොල්ල ශ්‍රී ලංකා සත්ත්ව පාලන විද්‍යාලය මගින් නිකුත් කරනු ලබන දෑ අවුරුදු ඩිප්ලෝමා සහතිකය ;

හෝ

II. අනුරාධපුර/සීප්පුකුලම සත්ත්ව පාලන පුහුණු මධ්‍යස්ථානය නිකුත් කරනු ලබන සත්ත්ව පාලනය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය ;

හෝ

III. ශ්‍රී ලංකා උසස් තාක්ෂණික ආයතනය යටතේ ක්‍රියාත්මක අම්පාර හාඩි උසස් තාක්ෂණික ආයතනය සහ නයිවල උසස් තාක්ෂණික ආයතනය මගින් නිකුත් කරන ලද කෘෂිකර්මය පිළිබඳ ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (N.D.T) ;

හෝ

IV. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ කුණ්ඩසාලේ ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය හා ඊට සමාන වෙනත් විද්‍යාල මගින් නිකුත් කරන ලද කෘෂිකර්ම ඩිප්ලෝමා සහතිකය ;

හෝ

V. තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පරිදි ජාතික වෘත්තීය කුසලතා (NVQ) (06) හෝ මට්ටමේ කුසලතාව සහිත කෘෂිකර්ම ඩිප්ලෝමා සහතිකය.

5.3 පළපුරුද්ද - අදාළ නැත.

5.4 කායික සුදුසුකම්.-

සෑම අපේක්ෂකයෙකු ම මධ්‍යම පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

5.5 වෙනත් සුදුසුකම්.-

I. අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

II. අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

III. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට (**2026.01.23**) පූර්වාසන්නයෙන් වූ වසර 03ක කාලය තුළ මධ්‍යම පළාත තුළ ස්ථිර පදිංචිකරුවකු විය යුතුයි. (නැතහොත් අයදුම්කරු මෙම පළාතේ වසර 03කට වඩා ස්ථිර පදිංචි අයෙකු සමඟ විවාහ වූ විට කලත්‍රයාගේ ස්ථිර පදිංචිය සලකා බැලේ.)

IV. යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු මෙම තනතුරුවලට ඉල්ලුම් කිරීම සඳහා සුදුසුකම් නොලබයි.

V. සේවයට බඳවා ගැනීම සඳහාවන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු අදාළ සියලු සුදුසුකම් හා නියමිත වයස් සීමාව 2026.01.23 දිනට සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

**06. වයස් සීමාව :**

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට (2026.01.23) වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

**07. විභාගය පිළිබඳ විස්තර :**

I. මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අයදුම්කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

II. අපේක්ෂකයා විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය.

III. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් විය යුතුය.

IV. විභාග මධ්‍යස්ථානය - මහනුවර දී පමණක් පවත්වනු ලැබේ.

**08. බඳවා ගැනීමේ ක්‍රමය :**

ලිඛිත තරග විභාගයක සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත තරග විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ. ලකුණු ප්‍රමුඛතාව අනුව පුරප්පාඩු සම්පූර්ණ කිරීමේ දී කිසියම් අවස්ථාවක ඉතිරිව ඇති පුරප්පාඩු සංඛ්‍යාවට වැඩි සංඛ්‍යාවක් සම ලකුණු ලබාගත් සුදුසුකම් ලත් අපේක්ෂකයන් සිටී නම් හා එම පුරප්පාඩු ද පිරවීමේ සේවා අවශ්‍යතාවයක් තත්කාලයේ පවතී නම්, එසේ සම ලකුණු ලබාගත් අපේක්ෂකයන් අතුරින් වැඩිදුර තෝරා ගැනීමක් සිදු කිරීමට මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකිය. එහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2024 හි පරිදි අදාළ තෝරා ගැනීම් සිදු කරනු ලබයි.

**09. ලිඛිත විභාගය :**

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 01. බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| 02. විෂයානුබද්ධ තාක්ෂණික ප්‍රශ්න පත්‍රය | පැය 02 | 100 | 40% |

| *ප්‍රශ්න පත්‍රය* | *විෂය නිර්දේශය* |
|---|---|
| 01. බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවය, විශ්ලේෂණ හැකියාව, කාල කළමනාකරණය , විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය. |

| ප්‍රශ්න පත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| 02. විෂයානුබද්ධ තාක්ෂණික ප්‍රශ්න පත්‍රය | තනතුරට අදාළව තාක්ෂණික දැනුම මැන බැලෙන බහුවරණ ප්‍රශ්න වලින් සමන්විත වේ.<br>*තාක්ෂණ ප්‍රශ්න පත්‍රයේ විෂය නිර්දේශය :*<br>1. ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයට පශු සම්පත් ක්ෂේත්‍රයේ දායකත්වය<br>2. ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප<br>3. ගව පාලනය<br>4. කුකුල් පාලනය<br>5. එළු පාලනය |
| 02. විෂයානුබද්ධ තාක්ෂණික ප්‍රශ්න පත්‍රය | 6. ඌරු පාලනය<br>7. හාවුන් ඇති කිරීම<br>8. ශ්‍රී ලංකාවේ සත්ත්ව පාලන තොරතුරු දත්ත හා සංඛ්‍යාලේඛන<br>9. කෘතිම සිංචනය<br>10. ගොවිපල කළමනාකරණය.<br>11. කෘෂිකාර්මික ව්‍යාප්තිකරණය<br>12. කිරි අතුරු නිෂ්පාදන සැකසීම හා ආහාර තාක්ෂණය<br>13. ගොවිපල් යාන්ත්‍රිකරණය<br>14. සත්ත්ව පෝෂණය<br>15. සත්ත්ව නිරෝධායනය<br>16. පාංශු විද්‍යාව හා කොම්පෝස්ට් නිෂ්පාදනය<br>17. වර්තමාන පශු සම්පත් සංවර්ධන ප්‍රතිපත්ති, පශු සම්පත් සංවර්ධන වැඩසටහන්, පශු සම්පත් අමාත්‍යාංශය යටතේ ඇති ආයතන හා එහි කාර්යය භාරයන්<br>18. වර්තමාන පශු සම්පත් ක්ෂේත්‍රය මුහුණ දෙන අභියෝග, පශු සම්පත් ක්ෂේත්‍රයේ සංවර්ධනය රටේ සංවර්ධනයට ආධාරවන අයුරු. |

**10.** ***අයදුම්කළ යුතු ක්‍රමය :***

I. අයදුම්පත්‍රය මෙම නිවේදනයට යා කොට ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව A4 කඩදාසියේ දෙපසම භාවිත කරමින් පිළියෙල කර අපේක්ෂකයා තම අත් අකුරින් ම පැහැදිලිව පිරවිය යුතුය. අංක 01 සිට 04 තෙක් පළමු පිටුවට ද, අංක 05 සිට 07 තෙක් දෙවන පිටුවට ද, අංක 08 සිට 12 තෙක් තෙවන පිටුවට ද, ඉතිරිය සිවුවන පිටුවට ද, වන සේ සකස් කළ යුතුය. සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතුය. නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අයදුම්පත්‍ර, අසම්පූර්ණ තත්වයේ පවතින අයදුම්පත්‍ර සහ නිවේදනයේ සඳහන් පරිදි මූලික සුදුසුකම් නොමැති බව අයදුම්පත්‍රයේ තොරතුරු අනුව පෙනී යන්නේ නම් ද කිසිදු දැනුම්දීමකින් තොරව එම අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරා ගත යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ඔබ ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.

II. අයදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතුය.

III. සෑම අපේක්ෂකයෙකුම රු 600.00 ක විභාග ගාස්තුවක් මධ්‍යම පළාත් සභාවට ගෙවිය යුතුය. මෙම විභාග ගාස්තුව මධ්‍යම පළාතේ ප්‍රධාන ලේකම්වරයාගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 ට බැරවන පරිදි අයදුම්පත්‍ර භාරගනු ලබන අවසාන දිනට හෝ ඊට ප්‍රථම මධ්‍යම පළාත තුළ පිහිටි ඕනෑම **ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට** මුදලින් ගෙවා, ඒ සඳහා ලබාගත් නිල් පැහැති ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. වෙනත් ශීර්ෂයකට ගෙවීම් කරන ලද කුවිතාන්සි හෝ මධ්‍යම රජයට අයත් කහ පැහැති කුවිතාන්සි අලවා ඇතොත් එම අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කරනු ලැබේ. එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. එකී ලදුපත නොමැතිව එවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර, විභාගය සඳහා ගෙවන ලද විභාග ගාස්තුව කිසිදු හේතුවක් මත හෝ ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ නොකෙරේ. තව ද විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

IV. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 ශ්‍රේණිගත කිරීමට අනුව තෘතීය හෝ ජ්‍යෙෂ්ඨ මට්ටමේ රජයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

V. අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුව නිවැරදිව සම්පූර්ණ කොට **2026.01.23** දිනට හෝ ඊට පෙර ලැබෙන සේ **'ලේකම්, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 244, කටුගස්තොට පාර, මහනුවර'** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ **"මධ්‍යම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයෙහි සත්ත්ව සංවර්ධන උපදේශක III ශ්‍රේණියට බඳවා ගැනීම - 2025"**යනුවෙන් සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේ දී අස්ථානගතවන අයදුම්පත් සම්බන්ධයෙන් මෙම කොමිෂන් සභාව වග කියනු නොලැබේ. අයදුම්කරන අවස්ථාව වනවිට පැවති අයදුම්කරුවන්ගේ තනතුර සහ සේවා ස්ථානය, විභාගය සම්බන්ධ සියලු කටයුතු සඳහා අදාළ වන අතර, අයදුම්පත් එවීමෙන් පසු ඒ සම්බන්ධව සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳව සලකනු නොලැබේ.

VI. අයදුම්පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධ ලිපියක් හෝ තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි පිළිබඳ සලකා බලනු නොලැබේ.

VII. අයදුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ.

VIII. විභාග නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත.

IX. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විසින් මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා, නිවේදනයට අනුව අදාළ සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ දී අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති බව අනාවරණය වුහොත් ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කෙරෙනු ඇත.

X. විභාග මධ්‍යස්ථානය පිළිබඳව මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශ පත්‍රය මගින් දැනුම් දෙනු ලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.psc.cp.gov.lk මගින් පළකරනු ඇත. ප්‍රවේශපත්‍ර විභාගය පැවැත්වීමට දින 14 කට පෙර අයදුම්කරුවන්ගේ අයදුම්පතෙහි සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනයට විද්‍යුත් තැපෑල මගින් හෝ අයදුම්කරු විසින් අයදුම්පතෙහි දක්වා ඇති ජංගම දුරකතන අංකය වෙත කෙටි පණිවිඩයක් (SMS) මඟින් යොමු කරනු ලැබේ.

XI. නිවේදනය පළ වී දින 04 ක් 05 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍ර නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ සහ මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක් ද, අයදුම්පත්‍රය ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, අතැතිව ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම නිවැරදිව සඳහන් කරමින් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ විභාග අංශය වෙතින් විමසිය යුතුය.

(දුරකතන අංකය : 081 – 2213097 )

11. විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍ර පළමුවෙන් ම විභාගයට පෙනී සිටින දින විභාග මධ්‍යස්ථාන භාර ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. එවැනි ප්‍රවේශ පත්‍රයක් ඉදිරිපත් නොකරන කිසිදු අපේක්ෂකයෙකුට විභාගය සඳහා පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

12. විභාගයට පෙනී සිටින සියලුම විභාග අපේක්ෂකයන් තමාට නියමිත විභාග මධ්‍යස්ථානයේ දී පමණක් විභාගයට පෙනී සිටිය යුතුය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන ඕනෑම දඬුවමකට යටත්වීමට ඔවුනට සිදුවනු ඇත.

13. ***අපේක්ෂකයාගේ අනන්‍යතාවය :***

මෙම විභාගයට අයත් සෑම විෂයය පරීක්ෂණයකදී ම විභාග ශාලාධිපතිවරයා සෑහීමකට පත්වන අයුරින් තම අනන්‍යතාව ඔප්පු කර සිටීමට අයදුම්කරුවන් ක්‍රියා කළ යුතුය. මේ සඳහා පහත දැක්වෙන කවර හෝ එක ලියවිල්ලක් ප්‍රමාණවත් වේ.

- පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත ;
- වලංගු රියදුරු බලපත්‍රය ;
- වලංගු විදේශ ගමන් බලපත්‍රය ;
- එමෙන්ම විභාග අපේක්ෂකයින් තම අනන්‍යතාව කහවුරු කරගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කරගනු නොලැබේ ;
- තව ද, විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි වන පරිදි මුහුණු හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

14. ***සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම :***

14.1. මෙම විභාගයට අදාළ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයෙකු ඊට පෙනී සිටීමට නුසුදුසු වෙතැයි පෙනී යන ලද නම්, විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ ඊට පසු හෝ යන කවර අවස්ථාවක දී වුවද ඔහුගේ /ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය.

14.2. අපේක්ෂකයෙකු විසින් සපයන ලද තොරතුරු පසු කලෙක දී වැරදි බව පෙනී ගියහොත් හෝ ඔහු /ඇය විසින් හිතාමතාම කිසියම් කරුණක් වසන් කරන ලද බව අනාවරණය වුවහොත් හෝ ඔහු /ඇය වෙත තවදුරටත් පත්වීමක් ලබා දීම සම්බන්ධයෙන් සලකා බලනු නොලබන අතර, මෙම විභාගය හේතුකොටගෙන දී තිබූ පත්වීම අහෝසි කිරීමට හෝ රජයේ සේවයෙන් පහකිරීමට වුවද යටත් වේ.

15. අයදුම්කරුවන්ගේ විභාග ප්‍රතිඵල මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන **www.psc.cp.gov.lk** මගින් පළ කරනු ඇත.

16. මෙම නිවේදනයේ ආවරණය වන/නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ද මෙම විභාගය පැවැත්වීම පිළිබඳව හෝ පැවැත්වීමෙන් පසුව තෝරාගැනීම් කිරීම/නොකිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳව අවසාන තීරණය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. එසේම මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ ගැන පැහැදිලි කිරීම, තීරණය කිරීම මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

17. මෙම බඳවා ගැනීම සම්බන්ධ විස්තර මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන **www.psc.cp.gov.lk** හි පළකර ඇති අතර, අදාළ අයදුම්පත්‍රය එහි දී බාගත කරගත හැකිය.

18. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්වෙනු ඇත.

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

**කේ. කේ. ජී. අයි. ඩී. පී. විජේතිලක,**
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත් සභාව.

2025 දෙසැම්බර් මස 26 වැනි දින,
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
අංක 244, කටුගස්තොට පාර,
මහනුවර.

ආදර්ශ අයදුම්පත්‍රය

**මධ්‍යම පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ සත්ත්ව සංවර්ධන උපදේශක III ශ්‍රේණිය සඳහා විවෘත බඳවා ගැනීම - 2025**

විභාග අංකය :- [ ]

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය (අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න.)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : [ ] (සිංහල - S, දෙමළ - T, ඉංග්‍රීසි - E)

(අදාළ මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.)

01. 1.1 මුලකුරු සමඟ නම :- ..........................................................................................................................................
Mr./Mrs./Miss (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(උදා :- SILVA A.B.C.D.)

1.2 මුලකුරු සමඟ නම :-..........................................................................................................................................
මයා/මිය/මෙනවිය (සිංහලෙන්/දෙමළෙන්)

1.3 මුලකුරුවලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :- ........................................................................................

1.4 මුලකුරුවලින් හැඳින්වෙන නම් (සිංහලෙන්/දෙමළෙන්):-..........................................................................................

02. 2.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :-....................................................................................................

2.2 විද්‍යුත් තැපැල් ලිපිනය : ..........................................................................................................................

2.3 ජාතික හැඳුනුම්පත් අංකය :- | | | | | | | | | | | | |

2.4 ස්ත්‍රී/පුරුෂ භාවය 0 -පුරුෂ , 1- ස්ත්‍රී [ ] (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

2.5 විවාහක/අවිවාහක බව :- අවිවාහක - 1 විවාහක - 2 [ ]

03. 3.1 උපන් දිනය :

| Y | Y | Y | Y | M | M | D | D |
|---|---|---|---|---|---|---|---|

3.2 අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට (2026.01.23) වයස :- අවු : ............, මාස : ................, දින : ...............

3.3 දුරකතන අංකය : ජංගම :- | | | | | | | | | | | ස්ථාවර :- | | | | | | | | | | |

(විභාගය සම්බන්ධව දැනුම් දීම සඳහා)

04. අයදුම්කරු ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය:-...........................................................................................................

| *ඡන්ද හිමි නාම ලේඛනයට අනුව පදිංචිය* | *2022* | *2023* | *2024* |
|---|---|---|---|
| මැතිවරණ කොට්ඨාසය | | | |
| ඡන්ද ප්‍රදේශය | | | |
| ඡන්ද කොට්ඨාසය | | | |
| ග්‍රාම නිලධාරි කොට්ඨාසය | | | |
| ගෘහ අංකය | | | |
| නමට ඉදිරියෙන් ඇති පිළිවෙල අංකය | | | |

05. කලත්‍රයාගේ ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය (අයදුම්කරු මෙම පළාතේ වසර 03 කට වඩා ස්ථිර පදිංචි අයෙකු සමඟ විවාහ වූ විට) :-

..............................................................................................................................................................................

| *ඡන්ද හිමි නාම ලේඛනයට අනුව පදිංචිය* | *2022* | *2023* | *2024* |
|---|---|---|---|
| මැතිවරණ කොට්ඨාසය | | | |
| ඡන්ද ප්‍රදේශය | | | |
| ඡන්ද කොට්ඨාසය | | | |
| ග්‍රාම නිලධාරි කොට්ඨාසය | | | |
| ගෘහ අංකය | | | |
| නමට ඉදිරියෙන් ඇති පිළිවෙල අංකය | | | |

06. ***අධ්‍යාපන සුදුසුකම්:-***

06.1 අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය:

වර්ෂය: ................ විභාග අංකය: .......................

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

06.2. අ.පො.ස. (උසස් පෙළ) විභාගය:

වසර :-................ විභාග අංකය :-.....................

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |

07. වෘත්තීය (තාක්ෂණ) සුදුසුකම් (වෘත්තීය සුදුසුකම් සනාථ කෙරෙන ලේඛනවල සහතික කළ පිටපත් ඇමිණිය යුතුය) :-

| ආයතනය | හදාරා ඇති පාඨමාලාව | පාඨමාලාවේ කාල සීමාව | NVQ මට්ටම | NVQ සහතිකපත් අංකය | සහතික අංකය හා වලංගු දිනය |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |

08. *වෙනත් සුදුසුකම්* :-

..........................................................................................................................................................................
..........................................................................................................................................................................
..........................................................................................................................................................................
..........................................................................................................................................................................

09. විභාග ගාස්තු රු. 600/- ගෙවීම පිළිබඳ තොරතුරු :

i. විභාග ගාස්තු ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නම :-..................................................................................
ii. දිනය :- .....................................................................................
iii. කුවිතාන්සි අංකය :- ..........................................................................

| |
|---|
| මුදල් ගෙවූ ලදුපත /රිසිට් පත නොගැලවෙන සේ මෙම කොටුව තුළ අලවන්න.<br><br>( ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ) |

08. ඔබ කිසියම් වරදකට උසාවියෙන් දඬුවම් ලබා තිබේද ?..............................................................
"ඔව්"නම් විස්තර දක්වන්න. :- ..........................................................................................................................

09. අයදුම්කරුගේ ප්‍රකාශය :-

මෙම අයදුම්පතේ මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. මෙහි සඳහන් කරුණු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව අනාවරණය වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සකු වන බවත්, පත්වීමක් ලැබීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් සේවයෙන් පහකිරීමට යටත් වන බවත් මා දනිමි. තව ද, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ප්‍රකාශ කරමි.

.................................. ..............................................,
දිනය අයදුම්කරුගේ අත්සන.

10. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන .......................................................................... මහතා/මහත්මිය/මෙනෙවිය මම පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය මා ඉදිරිපිට දී ................................. දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත්, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත් එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

................................. .............................................,
දිනය අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.
(නිල මුද්‍රාව සමග)

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :- .......................................................................................
තනතුර :- ........................................................................
ලිපිනය :- ........................................................................

01-54

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය සබරගමුව පළාත

**රත්නපුර දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානයෙහි පැවැත්වෙන එක් අවුරුදු වෘත්තීය කෘෂිකර්ම පුහුණු පාඨමාලාව හා සමගාමීව "ක්ෂේත්‍ර සහකාර (කෘෂිකර්ම)" ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 4 පුහුණු පාඨමාලාව - 2026 අධ්‍යයන වර්ෂය**

සබරගමුව පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා විසින් ඉහත පාඨමාලාව හැදෑරීම සඳහා ශිෂ්‍ය ශිෂ්‍යාවන් බඳවා ගැනීම පිණිස අයදුම්පත් කැඳවනු ලැබේ. පාඨමාලාව පවත්වනු ලබන්නේ සිංහල මාධ්‍යයෙනි. මෙම පාඨමාලාව කෘෂිකාර්මික අංශයේ රැකියා අවස්ථා මෙන්ම ස්වයං රැකියා පදනමක් මත ක්‍රියාත්මක වීමට ඉදිරිපත් වන්නන් සඳහා ඉලක්ක කර ඇත.

01. පාඨමාලාවේ ස්වභාවය :

- ප්‍රායෝගික හා න්‍යායාත්මක පුහුණුවක් ලෙස පවත්වනු ලබන මෙම පාඨමාලාව සාර්ථකව නිම කරන ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙත සබරගමුව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් සහතික පත්‍ර ප්‍රදානය කරනු ලැබේ.

- තව ද, තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව වෙතින් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 4 සහතිකය ද ප්‍රදානය කරනු ලැබේ.

- පාඨමාලාවේ අන්තර්ගත විෂයයන් පහත පරිදි වේ.

  - ක්ෂේත්‍ර සහයක (කෘෂිකර්ම) (NVQ) 4 පාඨමාලාවට අදාළව මොඩියුල,

| | | | |
|---|---|---|---|
| i. | A - 01S003M01 | - | කෘෂිකාර්මික මූලධර්ම |
| ii. | A - 01S003M02 | - | වී සහ අනෙකුත් ධාන්‍ය බෝග ස්ථාපිත කිරීම හා නඩත්තු කිරීම |
| iii. | A - 01S003M03 | - | අනෙකුත් ක්ෂේත්‍ර බෝග ස්ථාපිත කිරීම හා නඩත්තු කිරීම |
| iv. | A - 01S003M04 | - | උද්‍යාන බෝග ස්ථාපිත කිරීම හා නඩත්තු කිරීම |
| v. | A - 01S003M05 | - | අස්වනු නෙලීම සහ ප්‍රාථමික සැකසීම |
| vi. | A - 01S003M06 | - | ගොවිපල යන්ත්‍ර, උපකරණ සහ මෙවලම් නඩත්තු කිරීම |
| vii. | A - 01S003M07 | - | කෘෂිකාර්මික ව්‍යාපෘති වැඩසටහන් ක්‍රියාත්මකකිරීම |
| viii. | A - 01S003BM01 | - | වැඩබිම් සඳහා සන්නිවේදන කුසලතා |
| ix. | A - 01S003BM02 | - | භාෂා සාක්ෂරතාවය සහ ගණිතමය හැකියාව |
| x. | A - 01S003BM03 | - | කණ්ඩායම් වැඩ |
| xi. | A - 01S003BM04 | - | වෘත්තීය සෞඛ්‍යය සහ ආරක්ෂිත ක්‍රියාපටිපාටි අනුගමනය කිරීම |

මීට අමතරව,

- බද්ධ පළතුරු පැල තවාන් පාලනය, බද්ධ කිරීම, පළතුරු පැල කප්පාදු කිරීම, පැල සහතික කිරීම
- පටක රෝපන තාක්ෂණය, පටක රෝපිත පැල නිෂ්පාදනය හා පැල ඇඩි කිරීම
- පාංශු පරීක්ෂණ විද්‍යාගාරය හා සමගාමීව පාංශු පරීක්ෂණය පිළිබඳව හැදෑරීම
- සත්ත්ව පාලනය හා කෘෂි යන්ත්‍රෝපකරණය පිළිබඳව හැදෑරීමට අවස්ථාව උදා වේ.

02. පාඨමාලාව පවත්වාගෙන යාම :

වසරක කාලකින් සමන්විත පාඨමාලාවේ අධ්‍යයන වාර තුනක් වේ. දෙවන වාර අවසානයේ දී එනම්, මොඩියුල හදාරා නිම වූ පසු ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වේ. තව ද, මෙම මොඩියුල කාලසීමාව තුළ අඛණ්ඩ ඇගයීම් ද සිදු කෙරේ. පළමු හා දෙවන වාර තුළ දී අධ්‍යයන චාරිකා සැලසුම් කර ඇත. තුන්වන වාරය තුළ දී සෑම ශිෂ්‍ය ශිෂ්‍යාවකට ම තමන් තෝරාගත් විෂය ක්ෂේත්‍රයන් මත බාහිර කෘෂිකර්ම ව්‍යාපාරයක් / ආයතනයක් සමඟ සම්බන්ධ කරන අතර, ඒ අනුව කර්මාන්තගත පුහුණුවක් ලබා ගත යුතුය. එම කාර්යය නිමාවත් සමඟ අවසාන ඇගයීම් පවත්වනු ඇත. පාඨමාලාවට 85% පැමිණීම අනිවාර්ය වේ. මෙම පාඨමාලාව සාර්ථකව නිම කරන ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා සබරගමුව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් සහතිකයක් පිරිනමනු ලැබේ. එසේම මෙම ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව වෙතින් ක්ෂේත්‍ර සහකාර (කෘෂිකර්ම) - (NVQ) 4 තෘතීය හා වෘත්තීය සුදුසුකම් සහතිකය ලබා ගැනීමට හැකියාව ලැබේ.

03. බඳවා ගැනීමේ පටිපාටිය.-

i. අධ්‍යාපන සුදුසුකම් :

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ආගම, සිංහල භාෂාව (භාෂාව හා සාහිත්‍ය), ගණිතය හා විද්‍යාව ඇතුළුව සම්මාන 02ක් සහිතව විෂයයන් හයකින් දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත්වීම.

ii. වෙනත් සුදුසුකම් :

i. ශ්‍රී ලාංකික පුරවැසියෙකු වීම
ii. සියලුම අයදුම්කරුවන් අයදුම්පත් කැඳවන දිනට වයස අවුරුදු 17ත් 35 ත් අතර විය යුතුය.
iii. ප්‍රායෝගික කෘෂිකර්මයේ නියැලීමට සුදුසු සෞඛ්‍ය තත්ත්වයෙන් පසුවිය යුතුය. (මෙය සනාථ කිරීමට රජයේ වෛද්‍ය නිලධාරියෙකුගෙන් ලබාගත් සහතිකයක් සඳහා ලියාපදිංචියේ දී ඉදිරිපත් කළ යුතුය.)
iv. සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සබරගමුව පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා විසින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයකින් තෝරා ගනු ලැබේ.

සබරගමුව පළාතේ ස්ථිර පදිංචි සුදුසුකම් ලත් අය වෙතින් අයදුම්පත් කැඳවනු ලබයි.

04. මෙහි පහත ආකෘතිය අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත ප්‍රයෝජනයට ගනිමින් පිළියෙල කරගත් අයදුම්පත් සමඟ අ.පො. ස. (සා.පෙළ) විභාග ප්‍රතිඵල ලේඛනයේ සහතික කරන ලද ඡායාපිටපතක් ද අමුණා **2026.02.10** දිනට හෝ පෙර **ගොවිපළ කළමණාකරු (පුහුණු), රත්නපුර දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය, කරපිංච, කුරුවිට** ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

අයදුම්පත ලියාපදිංචි තැපැලෙන් යොමු කරන විට අයදුම්පත බහාලන කවරයේ වම්පස උඩ කෙලවරේ 2026 වසර NVQ 4 අයදුම්පත්‍රය ලෙස සඳහන් කළ යුතුය.

**2026 වර්ෂය සඳහා ශිෂ්‍ය ශිෂ්‍යාවන් බඳවා ගැනීමේ ආදර්ශ අයදුම්පත්‍රය**

රත්නපුර දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානයෙහි පැවැත්වෙන එක් අවුරුදු වෘත්තීය කෘෂිකර්ම පුහුණු පාඨමාලාව
"ක්ෂේත්‍ර සහකාර (කෘෂිකර්ම ව්‍යාප්ති)" ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 4 පුහුණු පාඨමාලාව

අපේක්ෂකයා පිළිබඳ තොරතුරු :

1. සම්පූර්ණ නම (සිංහලෙන්) :.......................................................................................

2. i. ලිපිනය :.......................................................................................
.......................................................................................
ii. දිස්ත්‍රික්කය :.......................................................................................
iii. පළාත :.......................................................................................

3. සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | |

4. මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | |

5. ජංගම දුරකථන අංකය :

6. ස්ත්‍රී/පුරුෂ භාවය - ස්ත්‍රී : පුරුෂ :

7. උපන් දිනය : වර්ෂය : මාසය : දිනය :

8. ජාතික හැඳුනුම්පත් අංකය :........................................................................................

9. මව/පියාගේ හෝ භාරකරුගේ නම :........................................................................................................................

10. මව/පියාගේ හෝ භාරකරුගේ ලිපිනය :.................................................................................................................

11. මව/පියාගේ හෝ භාරකරුගේ දුරකථන අංකය :....................................................................................................

12. හදිසි අවස්ථාවක දී දැනුම් දිය යුතු අය - නම හා දුරකථන අංකය :

නම :.................................................................................................................. දුරකථන අංකය :..........................................

13. අධ්‍යාපන සුදුසුකම්.-

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගය :

පළමුවර (..................වර්ෂය) විභාග අංකය : ..............................................

| *විෂයය* | *ලැබූ සාමාර්ථය* | *විෂයය* | *ලැබූ සාමාර්ථය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගය :

දෙවනවර (.................. වර්ෂය) විභාග අංකය : ..............................................

| *විෂයය* | *ලැබූ සාමාර්ථය* | *විෂයය* | *ලැබූ සාමාර්ථය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

(ඇ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ. පෙළ) විභාගය :

(.................. වර්ෂය) විභාග අංකය - (.....................................)

| *විෂයය* | *ලැබූ සාමාර්ථය* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

14. වෙනත් සුදුසුකම් හා බාහිර ක්‍රියාකාරකම්.-

(i)
(ii)
(iii)
(iv)

15. ඔබ උසස් අධ්‍යාපන ආයතනයක හෝ කාර්මික විද්‍යාලයක / ආයතනයක පාඨමාලාවක් සඳහා තේරී පත් වී සිටී ද? එසේ නම් ඒ පිළිබඳව විස්තර සඳහන් කරන්න.

.....................................................................................................................................................................

.....................................................................................................................................................................

ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. කිසියම් තොරතුරක් අසත්‍ය යැයි මා තෝරා ගැනීමෙන් පසුව හෙළිදරව් වුවහොත් කිසිදු පරීක්ෂණයකින් තොරව මාගේ ශිෂ්‍ය භාවය අවලංගුවන බව දනිමි.

.............................. ..............................................
දිනය අත්සන

01-40

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදනය භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරේමන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින්ම ගෙවිය යුතුය.

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු ගාස්තු රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

**උපලේඛනය**

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2026 වර්ෂය** | | | |
| **ජනවාරි** | 2026.01.02 | සිකුරාදා | 2025.12.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.01.09 | සිකුරාදා | 2025.12.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.01.16 | සිකුරාදා | 2026.01.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.01.23 | සිකුරාදා | 2026.01.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.01.30 | සිකුරාදා | 2026.01.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| **පෙබරවාරි** | 2026.02.06 | සිකුරාදා | 2026.01.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.02.13 | සිකුරාදා | 2026.01.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.02.20 | සිකුරාදා | 2026.02.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.02.27 | සිකුරාදා | 2026.02.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| **මාර්තු** | 2026.03.06 | සිකුරාදා | 2026.02.20 | සිකුරාදා | දහවල් | 03.00 |
| | 2026.03.13 | සිකුරාදා | 2026.02.27 | සිකුරාදා | දහවල් | 03.00 |
| | 2026.03.20 | සිකුරාදා | 2026.03.06 | සිකුරාදා | දහවල් | 03.00 |
| | 2026.03.27 | සිකුරාදා | 2026.03.13 | සිකුරාදා | දහවල් | 03.00 |

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ.බ.)*

2026 ජනවාරි මස 01 දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.